රුහුණ විශ්වවිද්‍යාලය

**2016/2017 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි - 3000 ස්ථලය**
**දෙවන සමාසික පරීක්ෂණය - 2018 මැයි (පැරණි නිර්දේශය)**

## SLS 3203 – සිංහල ගද්‍ය සාහිත්‍ය II

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
අපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

කාලය : පැය 03 යි.

01. i. පහත සඳහන ගද්‍ය පාඨ වත්මන් ලිහිල් බසින් ලියන්න.
ii. අංකිත පදවලට විවරණ සපයන්න.

(අ) මහසත් පැදුන් දස බලා ගොස් එක් වෙයෙකැ බැසැ "මා පියවර දිට්ඨමඞ්ගලිකාවට පැනෙවයි, ඇත් අස් ආදීන් විසින් නො මැකෙව" යි ඉටා කෙණෙසිඅහර සිඟා-ගෙනැ එක් සාලායෙකැ වළඳති. එ නුවර දෙවියෝ: "අප ගෙ සිල්වත් ගුණවත් වහන්සෙට ඔහු බුණු සෙ නො යෙදෙ" යි, දූහැවැ ගියහ. ඔවුන් කෙරෙහි නායක යක් දරුවා ග්‍රීවා ගෙනැ පෙරළා තිබි යැ. සෙසු යක්හු සෙසු බමුණන් ග්‍රීවා ගෙනැ පෙරළා තුබූහ. "මෙ මහපුරිසා පිතැ" යි, මෙළෙක් සිතින් (කුමරු) නො මැරූහ. කුමරහු මුහුණ පෙරැළී පිටි පස් බලා තුබුයෙ යැ. ඇස් පෙරැළී මළ මිනිසුන් ඇස් වැනි වි යැ. මියෙන් කෙළ පෙණ වැහෙයි. සිරිර තද වි යැ. අත්-පා දැඩි වී. සෙසු බමුණො මියෙන් පෙණ නඟමින් පෙරැළි-පෙරැළී අත්-පා සපත්. ඔහු ගෙ පරිජනයො ගොස් එ පවත් දිඪමඞ්ගලිකාවට කීහ. හො වෙළෙවි වැ පහයින් බැසැ ගොස් "ම-පුත්-හට මෙ කළාහු කවරහ යි කිව. ජනයෝ: "මෙයට ආ පහුල් පෙරෙවි මහණෙකැ මෙ කෙළෙ"යි කීහ.

(අමාවතුර, කෝදාගොඩ ඤාණාලෝක (සංස්.), පිටුව 82)

(ආ) බුදුබල දන්නා ශ්‍රද්ධාසම්පන්නයො "අද අප ගෙ සවාමි වූ තිලොගුරු සම්‍යක්සම්බුද්ධයන්ට ඇතෙක් නම් කුමක් කෙරෙද! ඥාන බලයෙන් මුළු ලොව දිනූහ, කායබලයෙන් කෙළදහසක් ඇත්නට බල ඇත්තාහ; දූන් සවාසන සර්වක්ලේශයන් නසා බුදු වූ කල්හි තබා තමන් බුදුවන්නට බෝමැඩ වැඩැහුන් දවස් පවා තමන් ගෙ අනුභාවයෙන් වශවර්තිමාරයා නැගි යෙළසියක් යොදුන් ගිරිමේඛල නම් මතැත්හු මද සිඳුවාපියා තමන් ශ්‍රීපාදයට නුදුරු තැන්හි කෙශරසිංහයක්හු දුටු ජරායෙන් රොම වැම්මැගිය මහලු කැණහිලක්හු සෙ වෙවුළම් ගන්වා, දළ බිමැ අන්වා, පිටහුන් මරහු මුහුණින් වැටී හෙත පරිද්දෙන් නැමී වඳනා වැඳුම් ගත්හ; පාරිලියක නම් මතැත් අනඳ මහතෙරුන් වහන්සෙ සෙ ඔවුන්ට මෙහෙ කෙරෙයි; මෙ ඇත්හු අද තමන් ගෙ ශ්‍රීපාදපද්මය බමරකු සෙ සුඹුනා පරිද්දෙන් ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය පෑ, එහි පහන් බොහො දෙන අමාමහනිවන්හි ලති; අද එ පෙළහර බලම්හ" යි සැරහී ගත්හ.

(බුත්සරණ (සංස්.) ලබුගම ලංකානන්ද හිමි, පිටුව 77)

(ඇ) නාරද තවුසෝ ද 'ආචාරීනි, මාගේ වරදෙක් නැත. නැතැයි කීවත් නොහදහා හැඩූ බැවින් වරද යම් කෙනකුන් කෙරෙහි වී නම් දෙනුන් හැඳින වස්සන් යන්නා සේ ඒ හැවිල්ල උන් කරා ම යේව' යි කියාලා තමන් අභිඥාලාභී ව අතීතයෙන් සතලිස්කපක් හා අනාගතයෙන් සතලිස්කපක් හා එක් ව අසූකපක් බලන්ට සමර්ථ හෙයින් මේ හැවිල්ල කවුරුන්ට පැමිණේ දෝහෝයි දිවසින් බලා උඩුසුළඟ සිට දූමූ රඩු දූමූවන් කරා ම යන්නා සේ ආචාරීන්ට පැමිණෙයි දැන සියලු ලෙඩ ම සන්හිඳුවන දිව්‍යබෙහෙදක් සේ එක ද කෙනකුන් නොතෝරා කරන කරුණා ඇති බුදුපැළ ව සිටිනා නාරද තවුසෝ දෙවළ තවුසන් කෙරෙහි කරුණාවෙන් තමන්ගේ ආනුභාවයෙන් රාත්‍රියේ තිස්පෑ ඉකුත් ව නැඟෙන හිර නැංග නුදුන්හු. නුවර ඇත්තෝත් හිර නොනැඟෙන සේ දැක රජ්ජුරුවන් කරා ගොසින් 'මුඹවහන්සේ රජකමට පටන්ගෙන මෙතෙක් දවස් නැඟෙන හිර අද මෙතෙක් වේලා වන තෙක් නොනැඟෙයි. රටතොටවලින් හවුරුදු නොයික්මවා බද්ද නංවන්නා සේ ම අදත් දවස නොඉක්මවා හිර නැංගුවමැනවැ' යි කිවූය.

(සද්ධර්මරත්නාවලිය - ප්‍රථම භාගය - ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම (සංස්.) පිටුව 72)

(ඈ) එසඳ බුදුරජානන්වහන්සේ "මේ කෙසේ වූ සතෙක් දෝ හෝ" යි අනවරණනියෙන් බලා "මහණෙනි, මේ මහාපුරුෂ කෙවලසත්වයෙක් නො වෙයි මෙලෙව සාරාසැකෙව්කප්සුවහසෙකින් මතුයෙහි කිඹුල්වත් නම් පුරවරෙහි සුදොවුන් රජු නිසා මහාමායාදේවී නම් රදුන් කුස පිළිසඳ පිළිලදින් වැඩී විය පැමිණ ඇසතුබෝමුල්හි විදුරසුන් අරා පස්මරුන් මරා ගොයුම් ගොත් ලොවුතුරා බුදු වෙ" යි සතුටු කැර ගුණබරණ ඉසිවරණ අතිවරණවිවරණ දී එසවූසඟ සමඟ සමන් මල් දෙසිවුම්ටින් පුද කැර වටා වැඩ නිකුත්සඳ, තුන්ලොවැසිදනා සතොසිනා සුවඳිනා වසනිනා බරණිනා පුදමිනා වඳිමිනා නිවණිනා පතමිනා සිටිසඳ, එ පෝසත් එ බෝසත් එ මල්පිට පලක් බැඳ කලක් ඉඳ, දන් සිල් නෙකම් පැණ විරිය කැත් සත් ඉටන් මෙත් උපෙයි කියනලද සියල් බුදුකුරුදම් සිය සතන්හි ම දැකැ පෙරුම් දම් ඉටන් කැර තමත් පත් නිවන් හැර මුළුලොවට මෙත් කැර ගොර දරුණු බවසයුර වැද කිමිද, ඉස් ඇස් මස් ලේ දූරි දරු දරා ඉදවත් මේ ආදි දීමෙන් සමතිස් පෙරුම් පුරා විසතුරුවෙසතුරුඅත්බැවින් චුත වැ, අසරන් තොසී කැර සුරන් නෙත් විසී කැර බුදු බැව් රිසී කැර තුසීපුර වසනසඳ

(දළද සිරිස (සං) වැලිවිටියේ සෝරත හිමි, පිටුව 03)

(ලකුණු 28)

02. "<u>අමාවතුරෙහි</u> අන්තර්ගත වන්නේ සංස්කෘතයට නැඹුරු වූ වර්ණනා ශෛලියක් නො වේ." ඔබේ අදහස් දක්වන්න.

03. භක්ති කාව්‍යයක් වශයෙන් <u>බුත්සරණ</u> සැලකීම යුක්තියුක්ත වේ දැ' යි අභිමත වර්ණනා ඇසුරෙන් විමසන්න.

04. සිංහල සාහිත්‍යයෙහි හමු වන බණපොතක් වශයෙන් <u>පූජාවලිය</u> සැලකිය හැකි දැ' යි සාකච්ඡා කරන්න.

05. <u>දළදා සිරිතෙහි</u> උචිත නිදර්ශන ආශ්‍රයෙන්, වෘත්තගන්ධි ශෛලියෙහි විශේෂතා පැහැදිලි කරන්න.

06. <u>සද්ධර්ම රත්නාවලියෙහි</u> කථා කලාවේ පැනෙන විශේෂතා අභිමත කථා වස්තු ඇසුරෙන් පහදන්න.

07. යහපත් සමාජයක් බිහි කිරීමේ අරමුණ සෑම ජාතක කථාවකින් ම ඉස්මතු වන ආකාරය නිර්දේශිත ජාතක කථා ඇසුරෙන් විමර්ශනය කරන්න.

(2 – 7 දක්වා පිළිතුරුවලට ලකුණු 13 බැගින්)

@@@@@@@@@@